සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

**නම/විභාග අංකය :.................................. නර්තනය - I** කාලය: පැය 03යි.

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(1) සිංහරාජ වන්නමේ බෙර පදය වන්නේ,
1. කුද ගත ගත දොමි
2. දො දොංත තකු දොං
3. දොම්කිත කිත දොමි
4. ජිකුතක තකු දොං

(2) "අතකට ගෙන රබන් පොඩිය වයති දිසි රුවින් " මෙම කවිය ගායනා කළ හැක්කේ,
1. මාත්‍රා 3 + 3 ට ය.
2. මාත්‍රා 2 + 2 ට ය.
3. මාත්‍රා 4 + 4 ට ය.
4. මාත්‍රා 3 + 4 ට ය.

(3) පැනීම් සරඹය
1. 10 වන ගොඩ සරඹයයි
2. 9 වන ගොඩ සරඹයයි.
3. 11 වන ගොඩ සරඹයයි.
4. 8 වන ගොඩ සරඹයයි.

(4) බුද්ධ, දේව, රාජ ප්‍රශස්ති සමඟ බැඳී පැවතුන ගායනා විශේෂයකි.
1. සවරං කවි
2. ලී කෙළි කවි
3. රබන් කවි
4. චාමර කවි

(5) ගොඩ සරඹ නර්තනයේ දී සුරල් පැගීමෙන් කස්තිරම ආරම්භ කරනු ලබන්නේ,
1. 9 වන ගොඩ සරඹයෙන් ය.
2. 11 වන ගොඩ සරඹයෙන් ය.
3. 5 වන ගොඩ සරඹයෙන් ය.
4. 8 වන ගොඩ සරඹයෙන් ය.

(6) ගැටබෙර වාදනයේ දී දෙවන බෙර සරඹය ලෙස හැඳින්වෙන්නේ,
1. තකට
2. කුදට කුදට
3. තකට කුදට
4. තකට තකට කුදට කුදට

(7) ගායනා හා දෙබස් මඟින් අදහස් ප්‍රකාශ කිරීම මෙසේ සඳහන් වේ.
1. ආංගික අභිනය.
2. වාචික අභිනය.
3. ආහාර්ය අභිනය.
4. සාත්වික අභිනය.

(8) උඩරට කස්තිරමට සමාන පහතරට නර්තන අංගය වන්නේ,
1. කලාසම
2. තානම
3. අන්තාඩිය
4. ඉරට්ටිය

(9) එකැස් බෙරය යනුවෙන් හඳුන්වන වාදන භාණ්ඩය,
1. රබාන
2. ගැටබෙරය
3. දවුල
4. තම්මැට්ටම

NWP EXAM

(10) මින් චාමර කවියක් වන්නේ,
1. වරලසා පිලසා නීල මල් දමින් ගොතා
2. ජලය සොඳයි බැසලා පීනන්නට
3. සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට
4. පැවිය ගල් රැහැන් විය රැස් වඩින්නට

(11) තාලම්පට වාදනයේ දී මුලින් ම නිපදවෙන ශබ්දය වන්නේ,
1. තෙයි  2. තිත්
3. තෙයි, තිත්  4. තෙයි, තෙයි

(12) උඩරට නර්තන සම්ප්‍රදායේ කාන්තාවන්ට වෙස් තැබීමේ මංගල්‍යයේදී හිසට පළඳිනු ලබන්නේ,
1. ජටාව  2. වෙස් තට්ටුව  3. නෙත්ති මාලය  4. පායිම්පත

(13) ත්‍රිවිධ ලය මෙනමින් ද හැඳින්වේ,
1. දෙගුණ, සමගුණ, සිව්ගුණ  2. සිව්ගුණ, සමගුණ, දෙගුණ
3. සමගුණ, දෙගුණ, සිව්ගුණ  4. දෙගුණ, සිව්ගුණ, සමගුණ

(14) පබළු ඇඳුම් කට්ටලය අයත් වන නර්තන සම්ප්‍රදාය වන්නේ,
1. සබරගමු නර්තන සම්ප්‍රදාය.
2. උඩරට නර්තන සම්ප්‍රදාය.
3. පහතරට නර්තන සම්ප්‍රදාය.
4. ද්‍රවිඩ නැටුම් සම්ප්‍රදාය.

(15) මෙම වචන උඩරට නර්තන සම්ප්‍රදායේ පමණක් භාවිතා වේ.
1. අඩව්ව, සීරුමාරුව, කලාසම  2. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, පා සරඹ
3. ඉරට්ටිය, කලාසම, අඩව්ව  4. කස්තිරම, සීරුමාරුව, ගොඩ සරඹ

(16) උඩරට 18 වන්නමට අයත් වේ.
1. අනිලා  2. මයුරා
3. කොවුලා  4. විරාඩි

පහත රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.




(17) B හා C රූප සටහන් වලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් වන්නේ,
1. පහතරට හා සබරගමු සම්ප්‍රදාය  2. උඩරට හා පහතරට සම්ප්‍රදාය
3. සබරගමු හා උඩරට සම්ප්‍රදාය  4. පහතරට හා උඩරට සම්ප්‍රදාය.

(18) B හා D රූප සටහන් වලින් දැක්වෙන්නේ,
1. සෝෂක බෙරය හා මගුල් බෙරයයි.  2. සෝෂක බෙරය හා හා දවුලයි.
3. සෝෂක බෙරය හා පොකුරු බෙරයයි.  4. පොකුරු බෙරය හා මගුල් බෙරයයි.

(19) දොං ජිජිගත යන බෙර පදය වාදනය කරනු ලබන්නේ,
1. D වාද්‍ය භාණ්ඩයෙන් ය.  2. B වාද්‍ය භාණ්ඩයෙන් ය.
3. C වාද්‍ය භාණ්ඩයෙන් ය.  4. A වාද්‍ය භාණ්ඩයෙන් ය.

(20) මාත්‍රා $2 + 3$ තාලයට ගායනය කරනු ලබන වන්නමකි.
1. සැවුලා වන්නම  2. සිංහරාජ වන්නම  3. තුරඟා වන්නම  4. වෛරොඩි වන්නම

NWEXAM

(21) ශෝකය නමැති ස්ථායිභාවය මගින් ඇතිවන රසය වන්නේ,
1. කරුණා රසයයි. 2. හාස්‍ය රසයයි. 3. ශාන්ත රසයයි. 4. වීර රසයයයි.

(22) අලංකාර පද නිර්මාණයේදී වඩාත් සැලකිලිමත් විය යුතු කරුණකි.
1. අවකාශ භාවිතය පමණක් යොදා ගැනීම.
2. නිවැරදි අංගහාර පමණක් භාවිතයට ගැනීම.
3. එක් ලයක් පමණක් භාවිතා කිරීම
4. කැරකීම්, පැනීම, සුරල් ආදිය භාවිතා කරමින් මාත්‍රා නිර්මාණය කිරීම

(23) තාල තැබීමෙන් පසුව ගායනය ආරම්භ වීම.
1. සමග්‍රහ යනුවෙන් හැඳින් වේ.
2. විෂමග්‍රහ යනුවෙන් හැඳින්වේ.
3. අවග්‍රහ යනුවෙන් හැඳින් වේ.
4. හිරු ග්‍රහ යනුවෙන් හැඳින්වේ.

(24) "ගත්ත තෙහිගු තකට තකුද ...." මෙය,
1. කස්තිරමකි. 2. සීරුමාරුවකි. 3. කලාසමකි. 4. අඩව්වකි.

(25) රජු පිළිබඳව ගුණ වර්ණනා කිරීම සඳහා යොදා ගත් ගායකයින් මෙනමින් හැඳින්වේ.
1. වන්දිබට්ටයින් 2. පුරෝහිතයින් 3. අතෝරකරුවන් 4. ආතුරයින්

(26) කොහොඹාකංකාරියට අයත් නර්තන අංග දෙකකි.
1. කොහොඹා හැල්ල, මාත්‍රා පහ
2. ගබඩා කොල්ලය, අඹ විදමන
3. අස්නේ, ආවැන්දුම
4. ආවැන්දුම, වන්නම්

(27) පහතරට බෙරයේ සම්මත දිග ප්‍රමාණය,
1. තුන්වියත් තුනඟුලකි.
2. දෙවියත් තුනඟුලකි.
3. තුන්වියත් දෑඟුලකි.
4. තුන්වියත් අඟුලකි.

(28) නර්තනය ප්‍රායෝගිකව භාවිතා කරන ආකාරය ලියා දක්වීම මෙනමින් හැඳින්වේ,
1. අංග රචනය 2. අනුකරණය 3. රංග රචනය 4. ප්‍රස්තාරකරණය

(29) කැණීම, හැරීම, ගැරීම යන ක්‍රියාකාරකම් දක්වෙන්නේ,
1. ධීවර කර්මාන්තයේ ය.
2. පතල් කර්මාන්තයේ ය.
3. මැටි කර්මාන්තයේ ය.
4. කෘෂි කර්මාන්තයේ ය.

(30) පූජාර්ථය සඳහා අත් රබාන භාවිතා කළ අවස්ථාවකි.
1. සූවිසි විවරණය
2. පන්සාළිස් වස
3. පෙරහැර
4. ශාන්ති කර්ම

(31) තම්මැට්ටමට සමාන විකල්ප වාද්‍ය භාණ්ඩයකි.
1. ටින් බෙරය
2. එක්ස්රේ බෙරය
3. දඬු බෙරය
4. චල් වලල්ල

(32) "වටත් අයට දැනෙනනටත් [illegible] මම" යන කවි පදය අයත් වන්නේ,
1. හනුමා වන්නමට ය.
2. සිංහරාජ වන්නමට ය.
3. [illegible] ය.
4. වෛරොඩි වන්නමට ය.

(33) දොං ජිං ජිං තකට දොංතකු යන බෙර පදය තාල තබනුයේ,
1. මාත්‍රා 2 + 3 තාලයට ය.
2. මාත්‍රා 2 + 4 තාලයට ය.
3. මාත්‍රා 3 + 3 තාලයට ය.
4. මාත්‍රා 3 + 4 තාලයට ය.



NWP EXAM

(34) උඩරට නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකි.

1. පණීභාරත මහාතා.
2. ප්‍රේමකුමාර එපිටවල මහතා.
3. සවුරිස් සිල්වා මහතා.
4. කෝට්ටේගොඩ මහතා.

(35) අතීතයේ නර්තනය හැදෑරීම සඳහා යොමු වූයේ,

1. පාසලට ය.
2. ගුරු ගෙදරට ය.
3. ප්‍රජා ශාලාවට ය.
4. දහම් පාසලට ය.

(36) පද කියමින් හා තාලම්පට වයමින් නර්තනය කරනු ලබන්නේ,

1. ගොඩ සරඹ
2. ඉලංගම් සරඹ
3. පා සරඹ
4. දොඹින පදය

(37) " ......................................... දොමිකිත ........................... කිතක දොමිතිගත ....................... කුද කුද" යන අඩව්වේ හිස්තැනට සුදුසු පද කොටස වන්නේ,

1. තත් තොග, කඩතක තරිකිට, කිත් තත්
2. තාම් දොමිතිගත, කිත් තත්, දොමිකිට
3. තත් තොග, තාම් දොමිතිගත, කිත් තත්
4. තාම් දොමිතිගත, කඩතක තරිකිට, කිත් තක්

(38) ගැට බෙරය වාදනයේ දී වම් ඇසට ගැසීමෙන් නිපදවන හඬ වන්නේ,

1. තත්, තොං
2. නං, තොං
3. තත්, ජිත්
4. ජිත්, නං

(39) එකම කතා ප්‍රවෘත්තිය කියවෙන ශාන්තිකර්ම දෙක වන්නේ,

1. පහන් මඩුව, කොහොඹාකංකාරිය
2. පහන් මඩුව, දෙවොල් මඩුව
3. පහන් මඩුව, ගම් මඩුව
4. කිරි මඩුව, ගම් මඩුව

(40) සෞන්දර්ය විෂය ඉගෙනීම තුළින් ශිෂ්‍යයෙකු තුළ වර්ධනය කළ හැක්කේ,

1. කායික වර්ධනය
2. සිරුරේ නම්‍යතාව
3. වින්දන ශක්තිය
4. නර්තන ශිල්පය

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :................................ නර්තනය - II

වැදගත් :

* පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

- හිස්තැන් පුරවන්න.

(1) (i) සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය ද්‍රවිඩ ජන නැටුමේ ............................................................ යනුවෙන් හඳුන්වයි.

(ii) දහවන ගොඩ සරඹයේ සරඹ නාමය වනුනේ ...................................................................... යි.

(iii) බෙර වාදනයේ දී ගර්භාක්ෂර ............................................................ නමින් හැඳින් වේ.

(iv) ''රටකට මව් සමගින් නැව් නැග'' ..... යන කවි පදය ................................................ ගායනා විශේෂයට අයත් වේ.

(v) පහතරට සම්ප්‍රදායේ වන්නම් ....................................................... නමින් හැඳින්වේ.

(vi) තුරඟා වන්නම ගායනා කරනුයේ මාත්‍රා ......................................................... තාලයට ය.

(vii) බණ්ඩාර දෙවි හත්කටුට්ව සහ වැදි යකුන් පුද ලබන්නේ .................................................. ශාන්ති කර්මයේ ය.

(viii) දොඹින පද අභ්‍යාස කරනු ලබන නර්තන සම්ප්‍රදාය වන්නේ ...................................................................... යි.

(ix) හේවිසි වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ දෙකකි.

i. .................................................................. ii. ..................................................................

(x) සී සෑම හා වලං සෑදීම සඳහා ගනු ලබන උපකරණ දෙකකි.

i. .................................................................. ii. ..................................................................

(2) (i) මාත්‍රා 2 + 3 තාලයට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) මාත්‍රා 4 + 4 තනි තිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න.

(iii) මාත්‍රා 4 + 4 තනි තිතට අයත් වන්නමක අඩව්ව ප්‍රස්තාර කරන්න.

(3) කෙටි සටහන් ලියන්න.

(i) වන්නම්

(ii) පංච තූර්ය භාණ්ඩ

(iii) ඔංචිලි වාරම්

(iv) ගැමි නැටුම්

(v) ගොඩ සරඹ

(4) ''ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ විමසීමේදී එය විවිධ කාල වකවානුවල විවිධ ස්වරූපයෙන් පැවතී ඇති බව විද්‍යාමාන වේ''

(i) ශ්‍රී ලංකාවේ නර්තන කලාව පැවති බවට සඳහන් වංශ කථා 4 ක් නම් කරන්න.

(ii) නර්තන කලාවේ වර්ධනය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති අයුරු වංශ කථා ඇසුරින් සාධක 2 ක් ඉදිරිපත් කරන්න.

(iii) දේශාඨන වාර්තා කරුවන් දෙදෙනෙකු නම් කොට ඉන් එක් අයෙකුගේ වාර්තාවක් සඳහන් කරන්න.

NWP EXAM

(5) පහත රූප සටහන උපයෝගී කරගනිමින් පිළිතුරු සපයන්න.



A



B



C

(i) A, B, C, රූප සටහන් වලින් දක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කර A රූප සටහනේ දක්වෙන ඇඳුම් කට්ටලය සඳහන් කරන්න.

(ii) B හා C රූප සටහන් වලට අයත් නර්තන සම්ප්‍රදායන්හි ප්‍රධාන ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(iii) ඔබ නම් කරන ලද ශාන්ති කර්මයක චාරිත්‍ර විධි 2 ක් නම් කර ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න.

(6) ''ආධුනික නර්තන ශිල්පියෙකු සරඹ අභ්‍යාස කිරීමෙන් නර්තනය සඳහා නියමිත අංගහාර සලකා ගනී.''

(i) උඩරට පා සරඹ ගණන හා හමාර පදය ලියන්න.

(ii) තුන්වන ගොඩ සරඹය ඇසුරු කර ගනිමින් ගොඩ නැගී ඇති සරඹයේ නාමය නම් කර එහි කස්තිරම ලියන්න.

(iii) පා සරඹ හා ගොඩ සරඹ අභ්‍යාසයෙන් ලබා ගන්නා කුසලතාවයන් 4 ක් ලියන්න.

(7) ''නර්තන කලාව හැදෑරීම තුලින් සාර ධර්ම වර්ධනය වේ''

(i) කණ්ඩායම් ක්‍රියාකාරකම් තුලින් ඔබ ලබා ගන්නා යහපත් ආකල්ප 4 ක් ලියන්න.

(ii) පංති කාමරය තුළදී ගුරු සිසු සම්බන්ධතා ඇතිවන පරිදි ක්‍රියා කරන ආකාර දෙකක් දක්වන්න.

(iii) රූපවාහිනී නර්තන වැඩසටහන් තුලින් සමාජ සාරධර්ම වර්ධනය වේද? විමසන්න.

NWP EXAM